

# හැකි තරමට වැඩ කරමු

ඉනාරා අවින්දි වියනගේ

# "හැකි තරමට වැඩ කරමු"

කර්තෘ ප්‍රකාශනයකි.

ප්‍රථම මුද්‍රණය 2023 දෙසැම්බර්

කතාව සහ චිත්‍ර

**ඉනාරා අවින්දි වියනගේ**

4 ශ්‍රේණිය

මහාමායා බාලිකා විද්‍යාලය

ISBN – 978-624-206-902-9

# පිදුම

මගේ මෙම පොත් පිංචය

මගේ ආදරණීය මහාමායා මෑණියන්ට ද

සෑම මොහොතකදීම වැරදි නිවැරදි කරමින්

මග පෙන්වූ

මගේ ආදරණීය පංතිභාර ගුරුමෑණියන්ට ද

මගේ දෙමාපියන්ට ද

සහෝදර සහෝදරියන්ට ද

මෙම පොත් පිංචය

ආදරයෙන් යුතුව පුදමි.

ඉනාරා අවින්දි වියනගේ

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

ඈත අතීතයේ එක්තරා ගංගාවක් අසළ කුහුඹුවෙක් තම නිවස තනාගෙන වාසය කළා. මොහුගේ නිවස අසළ පදිංචි වී සිටි පිළිහුඩුවා සහ පළඟැටියාට කුහුඹුවා බෙහෙවින් ඇලුම් කළා. මේ තිදෙනාම ඉතා කුලුපග මිතුරන් ලෙස වාසය කළා.



සීත කාලයේ දී ගැනීම පිණිස ආහාර රැස් කරමින් සිටි කුහුඹුවාට හදිසියේ ම යමක් මතකයට ආවා. ඒ පසු දිනට එළඹෙන කුහුඹුවාගේ උපන් දින උත්සවයයි.

පළගැටියාගේ නිවසේ ගිය වර පැවැත් වූ උපන්දින සාදයේ දී පිළියෙල කර තිබූ ආහාර ඔහුගේ මතකයට නැගී ආවා. තෘණ වලින් සෑදූ කේක් ද රෝස්ට් කල මාළුවා ද එදා කෑම මේසයේ අලංකාරය වැඩිකළ ඒවා වුණා.

කුහුඹුවා වහාම තම යහළුවන්ට උපන් දින උත්සවයට ආරාධනා කිරීම සඳහා නිවසින් පිටත් වුණා. පිළිහුඩුවාත්, පළගැටියාත් මේ උත්සවය පැවැත්වීමට කුහුඹුවාට උදව් කළා.



උපන්දින උත්සවයට හොඳ මාළුවකු අල්ලා ගැනීම තිදෙනාගේ අදහස වුණා. ඒ සඳහා නියම සුදුස්සා තමා යැයි පිළිහුඩුවා එකහෙළාම කියා සිටියා. එහෙත් පළගැටියා එයට විරුද්ධව නැගී සිටියා. මාළුවකු අල්ලාගෙන ඒමට තමාට ද හැකි බව පළගැටියා කියා සිටියා. ඉන්පසු පළගැටියා මාළුවකු අල්ලාගෙන ඒමට පිටත් වුණා.



මාළුවකු අල්ලාගෙන ඒමට ගිය තම මිතුරා ආපසු එනතෙක් යහළුවන් දෙදෙනා කෑම මේසය පිළියෙළ කරමින් සිටියා. බොහෝ රෑ බෝ වූ නමුත් පළගැටියා ආපසු පැමිණියේ නෑ.

"පළගැටියා සින්දු කිය කියා කොහේ හරි ඇති. එයා නම් හරිම යාළුවෙක් තමා" කුහුඹුවාත් පිළිහුඩුවාත් පළගැටියා ගැන එවැනි අදහස් පළ කළා.



අන්තිමේදී පිළිහුඩුවා ලොකු මාළුවකු හොටින් ඩැහැගෙන ආහාරය සඳහා පිළියෙල කරන්නට වුණා.



“මේ මොන පුදුමයක්ද? අපේ පළගැටියා නේද මේ?”

<u>මාළුවාගේ කුස තුළ සිටි පළගැටියා දැක යහළුවන් දෙදෙනා පුදුමයට පත්වුණා.</u>

තමාට කරන්නට බැරි දෙයක් කරන්නට යාමෙන් විපතට පත් වූ පළඟැටියා යහළුවන් දැක සතුටට පත්වුණා.

ඉන් පසු යහළුවෝ තුන් දෙනා එකතු ව උපන් දින සාදයට ඉතා අලංකාර කෑම මේසයක් පිළියෙල කර ගී ගයන්නටත් නටන්නටත් වුණා.....



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01